162841
2001/11/05
ද. 3000 L

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් පිළිබඳ අධ්‍යයනයක්

ශාස්ත්‍රවේදී පුරාවිද්‍යා (විශේෂ) උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනය


උපදේශක : කථිකාචාර්ය කේ.එම්.ඇලෙක්සැන්ඩර් කපුකොටුව මහතා

අධ්‍යයන වර්ෂය : 1996/1997

විභාග අංකය : SGA 5970

ලි.ප.අංකය : AR 34554

නම : පී.කේ.ඩී.වසන්තා ගුණසේකර

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ගංගොඩවිල .
නුගේගොඩ.


162841

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
22 OCT 2001
ගංගොඩවිල - නුගේගොඩ

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පිදුම | |
| ස්තුතිය | |
| හැඳින්වීම | I-II |
| සංකේත නිරූපණය | III |
| **පළමුවන පරිච්ඡේදය** | |
| ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාවේ ඉතිහාසය | 1-11 |
| **දෙවන පරිච්ඡේදය** | |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් හඳුනාගැනීම හා එහි නාමාවලිය | 12-28 |
| **තෙවන පරිච්ඡේදය** | |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත්හි අන්තර්ගතය | 29-54 |
| **සිව්වන පරිච්ඡේදය** | |
| පුස්කොළ පොත්හි භාෂා ලක්ෂණ හා අක්ෂර ලක්ෂණ | 55-61 |
| **පස්වන පරිච්ඡේදය** | |
| පුස්කොළ පොත් සැකසීමේ තාක්ෂණය | 62-69 |
| නිගමනය | 70-71 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 72-73 |
| රූප සටහන් | 74-75 |
| ඡායාරූප එලක | 76-89 |

# හැඳින්වීම.

1996/1997 අධ්‍යයන වර්ෂයේ පුරාවිද්‍යා විශේෂ උපාධි අවසන් වසර අනිවාර්ය විෂයට අයත් ස්වාධීන නිබන්ධන මාතෘකාව යටතේ මා තෝරා ගනු ලැබුවේ "ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් පිළිබඳ අධ්‍යයනයක්" යන මාතෘකාවයි.

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ශ්‍රී ලංකාව පුරාම ප්‍රකටව හා අප්‍රකටව විවිධ ආයතන,පුද්ගලයන් හා විහාරස්ථාන සතුව පවත්නා පුස්කොල පොත් ප්‍රමාණය සංඛ්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කළ නොහැකිවාසේම ලාංකීය අනන්‍යතාවයකින් යුත්, විදේශීය ආයතනවල පවත්නා පුස්කොල පොත්වල ප්‍රමාණය ද නිශ්චිතව කිව නොහැකි ය. නමුත් මෙම පුස්කොළ පොත් ප්‍රමාණයෙන් එක්තරා ප්‍රමාණයක් විවිධ නාමාවලීන් සකස් කොට මතු ආරක්ෂාව සඳහා ආරක්ෂිත ස්ථානයන් හි තැන්පත් කර ඇත .එනමුත් කිසිදු නාමාවලියකට හසු නොවූ පුද්ගලයින්,ආයතන හා විහාරස්ථානවල තිබෙන්නා වූ පුස්කොළ පොත් ද විශාල ප්‍රමාණයකි.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ අප්‍රකාශිත අංශයෙහි තැන්පත් කරන ලද පුස්කොළ පොත් එවැනි සඳහනකට ලක් නොවූ අවුරුදු සියයකටත් වඩා පැරණි විවිධ වටිනාකමින් පරිපූර්ණ වූ ග්‍රන්ථ විශේෂයකි.

ලේඛන කලාවේ විශේෂත්වයක් ගන්නා එම පුස්කොළ පොත් පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කිරීමට මා පොළඹවන ලද්දේ යට දක්වන ලද හේතුව හා මේ වනතෙක් ඒ පිළිබඳ කිසිඳු පුද්ගලයෙක් ගේ අවධානය යොමු නොවීම යන සාධකයි. ඒ අනුව ශ්‍රී ලාංකීය ලේඛන කලාවේ එක්තරා කඩයිමක් පිළිබඳව අධ්‍යයනය කිරීමට මේ පර්යේෂණය තුළින් බලාපොරොත්තු වෙමි.

ඒ අනුව අදාල මාතෘකාව යටතේ පර්යේෂණාත්මකව නිබන්ධනය සකස් කිරීමේ දී පුස්තකාලය ඇසුරින් ප්‍රාථමික,ද්විතික,තෘතිය යන මූලාශ්‍රයන් පරිශීලනය කිරීම, අදාළ විෂයය සම්බන්ධ උගතුන් සමඟ සාකච්ජා කරමින් සාර්ථකව කරුණු ගොනු කිරීම වැනි ප්‍රයත්නයන් මගින් සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරමි.

පුස්කොළ පොත් පිළිබඳ පර්යේෂණ කරමින් තොරතුරු රැස්කිරීමේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි නොවීම,පත්ඉරුවල හිඟකම,පත්ඉරු විනාශ වී තිබීම,පත්ඉරු අංකනය නොකිරීම,සංස්කෘත වැනි වෙනත් භාෂාවලින් ලියා තැබීම වැනි දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වූ අතර එම දුෂ්කරතාවයන් හැකිතාක් දුරට මඟ හරවා ගනිමින් පර්යේෂණය සාර්ථකව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.උදාහරණ ලෙස අක්ෂර වින්‍යාසය නිවැරදි නොවන වචන ඉදිරියේ වරහන් තුළ නිවැරදි වචනය යෙදීමෙන් නිබන්ධනය සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරමි.

"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් අධ්‍යයනයක්" යන තේමාව ඔස්සේ පරිච්ඡේද පහක් යටතේ පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබේ.

පළමු පරිච්ඡේදය වනුයේ ශ්‍රී ලංකා පුස්කොළ පොත් ලේඛන කලාවේ ඉතිහාසයයි. එහිදී ලොව අක්ෂර භාවිතය පිළිබඳ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලංකා ලේඛන කලාවේ ආරම්භය,ශිලාලේඛන මාධ්‍යයෙන් තල්පත් මාධ්‍යයට අවතීර්ණ වීම,පළමුවෙන්ම තල්පත් භාවිත කළ කාල පරිච්ඡේදය,තල්පත්වල වටිනාකම,ශ්‍රී ලංකාවේ දැනට පවත්නා පැරණිම පුස්කොළ පොත් ලේඛන, පුස්කොළ පොත් විනාශය හා පුස්කොළ පොත් ආරක්ෂා කර ගැනීම සඳහා සකස් කරන ලද වැඩපිළිවෙළ පිළිබඳවත් සාකච්ජා කිරීමට අපේක්ෂා කරමි.

දෙවන පරිච්ඡේදය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් එකිනෙක විස්තර කර එහි නාමාවලිය සකස් කරමින් ඒ තොරතුරු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත් හඳුනාගැනීම හා එහි නාමාවලිය යන තේමාව ඔස්සේ ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත .

තෙවන පරිච්ඡේදය යටතේ මා විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනුයේ පුස්කොළ පොත්හි අන්තර්ගතයයි.එම පරිච්ඡේදය හඳුන්වා ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සතු පුස්කොළ පොත්හි අන්තර්ගතය යනුවෙනි.

සිව්වෙනි පරිච්ඡේදය යටතේ පුස්කොළ පොත්හි භාෂා ලක්ෂණ හා අක්ෂර ලක්ෂණ යටතේ කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අතර පස්වන පරිච්ඡේදය මඟින් පුස්කොළ පොත් සැකසීමේ තාක්ෂණය යටතේ කරුණු ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත .ඒ යටතේ තල්පත් සකස් කර ගැනීම සඳහා කොතරම් පරිශ්‍රමයක් දැරිය යුතු ද යන්න හා ඒ සඳහා යොදු ගන්නා උපකරණ ආදිය කෙරෙහි ද අවධානය යොමු කරනු ඇත .

අවසානයේ දී නිගමනය,ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය,රූප සටහන් හා ඡායාරූප එලක ඇතුළත් කරමින් පර්යේෂණ නිබන්ධනය නිමාවට පත් වේ.